*සැ. යු.*- 2018.08.10 දින පළ වූ අංක 2,084 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,085 - 2018 අගෝස්තු මස 17 වැනි සිකුරාදා - 2018.08.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1232 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 1233 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - මුදල් පනත් කෙටුම්පත 2018 අගෝස්තු මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 සැප්තැම්බර් මස 07 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අගෝස්තු මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## වයඹ පළාත් සභාවේ 1995 අංක 05 දරන පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යටතේ කරනු ලබන නිවේදනය

වයඹ පළාතේ, පළාත් සභාවේ සමූපකාර සංවර්ධන, වෙළෙඳ, ඉඩම්, විදුලිබල හා බල ශක්ති, ක්‍රීඩා හා යෞවන කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ පළාත් අමාත්‍ය රාමනායක රාජපක්ෂ මුදියන්සේලාගේ පියසිරි රාමනායක වන මම වයඹ පළාත් සභාවේ 1995 අංක 05 දරන පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 3 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර, සංස්ථාපනය කරන ලද වයඹ පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවට එකී ප්‍රඥප්තිය 05(01) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත නම් සඳහන් අය 2018.07.16 වැනි දින සිට 2021.07.15 වැනි දින දක්වා කාලය සඳහා වයඹ පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජික වශයෙන් පත් කරන ලද බැව් මෙයින් නිවේදනය කරමි.

| *නම* | *ලිපිනය* |
|---|---|
| චරිත් ධනුෂ්ක වීරකෝන් මහතා. | ''සිසිලස'', ජයවීදි මාවත, වෙන්නප්පුව. |

රාමනායක රාජපක්ෂ මුදියන්සේලාගේ පියසිරි රාමනායක,
සමූපකාර සංවර්ධන, වෙළඳ, ඉඩම්, විදුලිබල හා බල ශක්ති,
ක්‍රීඩා හා යෞවන කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු සහ
තොරතුරු තාක්ෂණය පිළිබඳ අමාත්‍ය (වයඹ පළාත).

2018 ජූලි මස 16 වැනි දින.

08-486

---

## ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව විසින් සකස් කර විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා සබරගමුව පළාත් සභාව විසින් සම්මත කරන ලද බව *ගැසට් පත්‍රය* මගින් නිවේදනය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වන උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලදුව 2015.02.26 වැනි දින පැවති එකී ප්‍රාදේශීය සභාවේ මාසික රැස්වීමේදී සම්මත කරනු ලැබූ සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වන වගන්තියේ (11) වන උප වගන්තියෙන් සබරගමුව පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016.02.12 දිනැති අංක 1954 *ගැසට්* පත්‍රයේ IV (අ) වන කොටසේ නිවේදනය කරනු ලැබූ මහජන පුස්තකාලය විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන උප වගන්තියේ (3) වන උප වගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 125 වගන්තිය ප්‍රකාර, සබරගමුව පළාතේ පළාත් සභාව විසින් 2017.09.26 වැනි දින සබරගමුව පළාත් සභාවේ දී කියවා සම්මත කරනු ලැබූ බව නිවේදනය කරනු ලැබේ.

ශ්‍රියානි පද්මලතා,
ලේකම්,
නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, වනිතා කටයුතු,
සමූපකාර, වෙළෙඳ හා ආහාර, මඟී ප්‍රවාහන සහ
වතු සුබසාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා
ඉදිකිරීම් කටයුතු අමාත්‍යාංශය.

2018 ජූලි මස 26 වැනි දින.

08-514

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය 03 සේවා ගණයේ තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම - 2018

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය 03 සේවාගණයේ තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඇති ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. 1.1 *මාසික වැටුප් පරිමාණය* : මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016ට අනුව MT1-2016 වන අතර,
29,840 - 10x300 - 11x350 - 10x560 - 10x660 - 48,890 වේ. (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන 11 ප්‍රකාරව වැටුප් ගෙවනු ලැබේ.)

   1.2 *දීමනා* : රජය විසින් අනුමත ජීවන වියදම් දීමනා වැටුපට අමතරව ගෙවනු ලැබේ.

2. *වයස් සීමාව.-*

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2018.08.31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි අයදුම්කරුවන් හට මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකිය. පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන දිනට උපරිම වයස් සීමාව ඉක්මවා නොතිබිය යුතුය.

3. *අධ්‍යාපන සුදුසුකම්.-*

සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

4. *වෘත්තීය සුදුසුකම්.-*

ඉහත අංක 3 හි අධ්‍යාපන සුදුසුකම් සහිතව රජය විසින් අනුමත ආයතනයක් මගින් පිරිනමනු ලබන, දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාවක් ලබා තිබීම.

*හෝ*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2012 ප්‍රකාරව අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම්වල (NVQ) 05 වන මට්ටමේ පාඨමාලා (කෘෂිකර්ම) සහතිකය ලබා තිබීම.

*හෝ*

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉහත සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් ලබා තිබීම.

5. *කායික සුදුසුකම්.-*

සෑම අපේක්ෂකයෙකුම බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

6. *අනෙකුත් සුදුසුකම්.-*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(ii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) 2018.08.31 දිනට පූර්වාසන්න වසර 03ක කාලය තුළ බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය යුතුය.
(iv) තනතුරට බඳවා ගැනීම සඳහා අවශය වන ඉහත සඳහන් සියළුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. *තනතුරෙහි කාර්යයන්.-*

කෘෂිකාර්මික සංවර්ධන කටයුතු හා ව්‍යාප්ති කටයුතුවලදී නවීන තාක්ෂණය ගොවි ජනතාව අතරට රැගෙන යාම, ඔවුන් පුහුණු කිරීම හා රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සහාය වීම.

8. *බඳවා ගැනීමේ ක්‍රමය.-* (පුරප්පාඩු සංඛ්‍යාව - 20)

ලිඛිත තරග විභාගයකට පෙනී සිට ඉන් ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

*ලිඛිත විභාගය :*

| | *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| i. | බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| ii. | තාක්ෂණ විෂය හා විෂයානුබද්ධ පරීක්ෂණය | 100 | 40% |

ලිඛිත විභාගයේ විෂය නිර්දේශය

*බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය - 3 තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) තනතුරෙහි III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය*

1. *විභාගයේ නම -*

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 3 තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) තනතුරෙහි III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය.

2. *විභාගය පිළිබඳ විස්තර.-*

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය පැය* | *මුළු ලකුණු* | *අවම සමත් ලකුණු* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 01 | 100 | 40% |
| තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය | 03 | 100 | 40% |

1. *විෂය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | තර්කන ශක්තිය, ගණිත කුසලතාවයන්, තාර්කික තීරණ ගැනීම හා කාලය කළමනාකරණය කිරීම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ ප්‍රශ්නවලින් යුක්ත ය. |
| | 1. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය.<br>1.1 දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය.<br>1.2 රැකියා වියුක්තිය<br>1.3 කෘෂිකර්මාන්තයේ අපනයන හා ආනයන තත්ත්වය |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය | 2. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම<br>3. පස හා ශාක පෝෂණය<br>3.1 පසේ ව්‍යුහය, වයනය, භෞතික හා රසායනික ලවණතාවය හා බෝග වගාව කෙරෙහි බලපෑම<br>3.2 ශාක පෝෂණය, පාංශු/ශාක පෝෂණය කළමනාකරණය<br>3.3 පැළැටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු<br>4. වී නිෂ්පාදනය<br>4.1 පාංශු දේශගුණික අවශ්‍යතාවය<br>4.2 ප්‍රභේද<br>4.3 බිම් සකස් කිරීම හා තවාන් පාලනය<br>4.4 පළිබෝධ හා රෝග මර්දනය<br>4.5 පොහොර යෙදීම<br>4.6 ජල කළමනාකරණය/ අස්වනු වැඩි කර ගැනීමේ නූතන ක්‍රම වේදය<br>4.7 අස්වනු නෙළීම හා පසු අස්වනු තාක්ෂණය<br>5. වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය<br>5.1 ලොකුළූනු, මිරිස්, අර්තාපල්, බඩඉරිඟු සහ වෙනත් බෝගවල ප්‍රභේද<br>6. එළවළු නිෂ්පාදනය<br>6.1 එළවළු තවාන් පාලනය<br>6.1.1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විශේෂ අවධානය යොමු කර ඇති එළවළු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු, අස්වනු නෙළීම හා සැකසීම<br>7. පළතුරු<br>7.1 කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු කර ඇති පළතුරු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු<br>7.2 අස්වනු නෙළීම හා සැකසීම<br>8. බෝග ආරක්ෂණය<br>8.1 බෝග වගාවට වැළඳෙන ප්‍රධාන රෝග හා පළිබෝධ හඳුනා ගැනීම සහ පාලන විධි<br>8.2 වල් මර්දනය, වල් මර්දන ක්‍රම<br>8.3 පිළිබෝධ නාශක පාලනයේ දී පිළිපැදිය යුතු ආරක්ෂිත ක්‍රම<br>9. ජල වහනය හා එහි වැදගත්කම<br>10. පාංශු රසායන<br>10.1 පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම<br>11. වාරිමාර්ග හා ජල කළමනාකරණය<br>11.1 විවිධ බෝග වර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය<br>11.2 ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය | 12. ගොවිපල් යාන්ත්‍රීකරණය<br><br>12.1 ගොවිපල් යාන්ත්‍රීකරණයේ වාසි අවාසි<br>12.2 බිම් සකස් කිරීමට භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණය<br>12.3 ජල සම්පාදනය හා පැලෑටි ආරක්ෂණය සඳහා භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ<br>12.4 ඉහත යන්ත්‍ර ක්‍රියාකරවීම හා නඩත්තුව<br><br>13. මී මැසි පාලනය<br><br>13.1 ආර්ථික වැදගත්කම<br>13.2 මී මැසි ගෘහ ආරම්භ කිරීම හා පවත්වා ගෙන යාම<br>13.3 අස්වනු ලබා ගැනීම හා වෙළඳ පොළට සකස් කිරීම<br><br>14. මල් වගාව හා භූමි අලංකරණය<br><br>14.1 ආර්ථික වැදගත්කම<br>14.2 භූමි අලංකරණ ක්‍රම<br>14.3 වෙළෙඳපොළ සඳහා කැපූ මල් නිෂ්පාදනය හා ඒවා වෙළෙඳපොළට සකස් කිරීම.<br><br>15. ආරක්ෂිත බෝග වගාව<br><br>15.1 වැදගත්කම<br>15.2 සැලසුම් කිරීම<br>15.3 බෝග තෝරා ගැනීම<br>15.4 පවත්වා ගෙන යාම හා අස්වනු සකස් කිරීම<br><br>16. සත්ත්ව පාලනය<br><br>16.1 කුකුල් පාලනය හා කිරි ගව නිෂ්පාදනය<br>16.2 සමෝධාන ගොවිපල් පාලනය යටතේ ඉහත සඳන් සත්ත්ව නිෂ්පාදන පවත්වා ගැනීම<br><br>17. කෘෂිකාර්මික ව්‍යාප්තිය<br><br>17.1 කෘෂිකාර්මික ව්‍යාප්ති උපාය මාර්ග හා ක්‍රමවේදය<br>17.2 කෘෂිකර්ම ව්‍යාප්ති සන්නිවේදන ක්‍රම<br><br>18. පටක රෝපණය<br><br>18.1 පටක රෝපණයේ මූලික සිද්ධාන්ත හා අතීත තොරතුරු පිළිබඳ දැනුම<br>18.2 පටක රෝපණයේ භාවිතයන්/ යෙදීම් උදාහරණ<br>18.3 පටක රෝපණයේ වාසි අවාසි<br><br>19. පැළෑටි නිරෝධායනය පිළිබඳ දැනුම<br><br>19.1 පැළෑටි නිරෝධායන රෙගුලාසි පිලිබඳ දැනුම<br>19.2 පැළෑටි නිරෝධායන ක්‍රම |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය | 20. ශාක සංරක්ෂණය<br><br>20.1 ශාක සංරක්ෂණයේ වැදගත්කම (ශාක/ජාන ප්ලාස්ම)<br>20.2 ශාක සංරක්ෂණ ක්‍රම (ශාක/ජාන ප්ලාස්ම)<br><br>21. ජෛව තාක්ෂණය<br><br>21.1 DNA වල වැදගත්කම<br>21.2 ජානය යනු කවරක්ද, එහි ක්‍රියාකාරීත්වය<br>21.3 ජාන ඉංජිනේරු ශිල්ප ක්‍රම මගින් ශාක වැඩිදියුණු කිරීමට ඇති හැකියාව<br><br>22. කෘෂිකර්ම සංවර්ධනය<br><br>වර්තමාන කෘෂිකර්ම සංවර්ධන ප්‍රතිපත්ති, ඒවායේ ඇති වැදගත්කම කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන්, කෘෂිකර්ම සංවර්ධනය හා සම්බන්ධ රේඛීය අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන, බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන, හා ඒවායේ කාර්ය භාරය, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්තමාන ගැටළු හා අභියෝග, කෘෂිකාර්මික සංවර්ධනය රටේ සංවර්ධනයට ආධාර වන ආකාරය, කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන්වල යහපත් හා අයහපත් බලපෑම්. |

8. *අයදුම්කිරීමේ ක්‍රමය :*

මෙම *ගැසට්* නිවේදනය සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව, ඒ4 ප්‍රමාණයේ (සෙ. මී. 21x23) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018.08.31 දිනට පෙර "ලේකම්, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග,ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බ. ප.), බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ල, 8 වන මහල, අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2018" යනුවෙන් සඳහන් කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. මෙම නිවේදනයට අනුව අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවකදී ඔවුන් විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අය හට පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනයේ ඇතුළත් කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

එන්. නිල්වල,
ලේකම්,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ
ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බ. ප.).

බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ල,
8 වන මහල, අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 03 සේවා ගණයේ තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම - 2018**

01. I. මුලකුරු සමග නම :..........................................................................

II. මුලකුරු වලින් හැඳින්වෙන නම් :..........................................................................

..........................................................................

02. I. ස්ථිර ලිපිනය :..........................................................................

II. රාජකාරී ලිපිනය :..........................................................................

III. දුරකථන අංකය : පෞද්ගලික :.......................... රාජකාරී :..........................

03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :.....................................................

04. I. උපන් දිනය :..........................

II. 2018.08.31 දිනට වයස : අවු. :.......................... මාස :.......................... දින :..........................

(සම්මුඛ පරීක්ෂණයේ දී උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතු ය.)

III. ජා. හැ. අංකය :..........................................................................

05. ස්ත්‍රී/පුරුෂ භාවය :..........................................................................

06. අධ්‍යාපන සුදුසුකම් :

(සහතික මගින් සනාථ කළ යුතු ය. සම්මුඛ පරීක්ෂණයේදී සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.)

අ. පො. ස. (සා. පෙළ) විභාගය :

වර්ෂය :.......................... විභාග අංකය :..........................

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| 1. .......................................................... | ............................ |
| 2. .......................................................... | ............................ |
| 3. .......................................................... | ............................ |
| 4. .......................................................... | ............................ |
| 5. .......................................................... | ............................ |
| 6. .......................................................... | ............................ |
| 7. .......................................................... | ............................ |
| 8. .......................................................... | ............................ |

07. මෙම බඳවා ගැනීමේ/*ගැසට් නිවේදනයේ* අංක 04 අනුව, ඉල්ලුම් කරන තනතුරට අදාල වෘත්තීය සුදුසුකම් :

ඩිප්ලෝමාවේ/ පාඨමාලාවේ නම :..........................
ඩිප්ලෝමාවේ/ පාඨමාලාවේ කාල සීමාව ............................ සිට ............................ දක්වා
ඩිප්ලෝමාව/ පාඨමාලාව හදාරන ලද ආයතනය :............................
ඩිප්ලෝමාවේ/ පාඨමාලාවේ සහතිකය වලංගු දිනය :............................

............................................................ වන මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි මා විසින් සපයන ලද තොරතුරු අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෙලි වුවහොත් එසේ සාවද්‍ය බව හෙළි වූයේ තෝරා ගැනීමට පෙර නම් මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි. තවද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

......................... ..........................
දිනය අයදුම්කරුගේ අත්සන.

08. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අය සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

...................................................................... මයා/මිය/මෙය මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ............................................................ වශයෙන් ........................ දින සිට සේවය කරන බවත්, පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර වෙනත් විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවත්, සේවා කාලය තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති/නැති බවත්, පූර්වාසන්න වසර 02 තුළ වැටුප් රහිත නිවාඩු ලබා ඇති/ නැති බවත් අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් සහතික කරමි.

........................ ..........................................
දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

08-668

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.